**ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරිය - 2022**

**-----------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණුකිරීම් අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

#### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඕස්ට්‍රියානු ව්‍යාපෘති අරමුදලින් 2020 වර්ෂයේදී ලැබී තිබුණු රු.2,084,556,810 ක් වටිනා ගොඩනැගිලි, පුහුණු උපකරණ හා අස්පෘෂ්‍ය වත්කම් සමාලෝචිත වර්ෂය තුලදී ද ගිණුම්ගත කිරීමකින් තොරව හෙළිදරව් කිරීම පමණක් සිදු කර තිබුණි. | 2020 වර්ෂයේදී අවසන් වූ ඕස්ට්‍රියානු ව්‍යාපෘතියකින් කටුනායක ඉංජිනේරු තාක්ෂණික ආයතනයට ලැබී තිබුණු මෙම වත්කම්වල 2022.12.31 දින වන විටත් ප්‍රමාණාත්මක තොරතුරු නොමැති හෙයින් ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව. | ආයතනයට ලැබී තිබුණු සියලු වත්කම් නිවැරදිව ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී පුහුණු කටයුතු සඳහා පරිත්‍යාගයක් ලෙස ලැබී තිබු මෝටර් රථයේ ආනයනික වටිනාකම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් 2021 වර්ෂය තුලදී සිදුකල වත්කම් ප්‍රත්‍යාගණයේදී එම වාහනයේ ශුද්ධ අගය වූ රු.1,256,152 කින් ප්‍රත්‍යාගණන සංචිතය වැඩියෙන් හා ප්‍රාග්ධන ප්‍රදාන අඩුවෙන් දක්වා තිබුණි. | මෙම වාහනයේ රු.2,405,534.00 ක්වූ ආනයනික වටිනාකම පුහුණු උපකරණ හා ප්‍රාග්ධන ලැබීම් ගිණුමට ගිණුම් ගත කර නොමැති බව. | පුහුණු උපකරණයක් ලෙස ලැබුණු මෝටරථයේ ආනයනිත වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ඇ) | අධිකාරිය සතු රු.5,280,000 ක්වූ ඉඩම් 03 ක වටිනාකම සහ මුලතිව් හා ගම්පහ පිහිටි පර්චස් 167.5 ක ඉඩම් කට්ටි දෙකෙහි වටිනාකම තක්සේරුකර ගිණුම් ගත කර නොතිබුණි. | ගිණුම් වලින් මඟ හැරී තිබුණු හිමිකාරීත්වය අධිකාරිය සතු යාපනය ඉඩම, කටුනායක නේවාසිකාගාරය හා කටුබැද්ද නිල නිවාසය පිහිටි ඉඩම්වල වටිනාකම් 2023 වර්ෂයේදි ගිණුම් ගත කිරීමට කටයුතු කර ඇති බව. | ආයතනය සතු සියලුම වත්කම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දින කල්බදු පදනම මත ලබාගත් රු.341,726,574 ක් වටිනා ඉඩම් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ක්‍රමක්ෂය නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අතිරික්තය රු.3,261,884ක් බැගින් ද ඉඩම් රු.6,523,768 කින් ද වැඩියෙන් දක්වා තිබුණි. | පසුගිය වර්ෂ සඳහා හා 2022 වර්ෂය සඳහා ගණනයකරන ලද ක්‍රමක්ෂය අංක 534 ජර්නලයෙන් ගිණුම්ගතකර ඇති බව. | කල්බදු පදනම මත ලබාගත් ඉඩම් ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 වර්ෂයේදී පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ටැබ් යන්ත්‍ර 500 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි. | අදාල ආයතන විසින් ටැබ් යන්ත්‍ර සඳහා නිවැරදි ඉන්වොයිසියක් ලබා දී නොතිබුණු අතර 2023 වර්ෂයේදි නිවැරදි කරන බව. | ආයතනය සතු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2017 සිට 2022 කාලපරිච්ඡේදය තුළ ඉදිකිරීම් වැඩ අවසන් කර තිබුණු කොන්ත්‍රාත් 06 ක රු.1,495,555 ක අත්තිකාරම් මුදල ප්‍රාග්ධනිත කර නොතිබීම හා එකතුව රු.20,103,595 ක් වූ අත්තිකාරම් පියවීම ගිණුම්ගත නොකිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.21,599,150 කින් වැඩියෙන් ද ගොඩනැගිලි වටිනාකම රු.1,495,555 කින් හා කෙරීගෙන යන වැඩ වටිනාකම රු.20,103,595 කින් අඩුවෙන් ද දක්වා තිබුණි. | අවසන්කරන ලද රු. 1,495,555 ක ඉදිකිරීම් මෙම වර්ෂයතුල ප්‍රාග්ධනිත කරන ලද බව. | වැඩ අවසන් කරන ලද කොන්ත්‍රාත් වටිනාකම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අධිකාරිය වෙත මුද්‍රණය කර ලබාදී තිබුණු සහතික පත් වෙනුවෙන් එම කොමිෂන් සභාව වෙත ගෙවියයුතු රු.20,638,200 ක් හා මුද්‍රණ කටයුතු වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට ගෙවිය යුතු රු.3,960,200 ක් ගිණුම් ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ප්‍රතිපාදන වලින් මෙම ගෙවීම සිදු කිරීමට කටයුතු කරනු ඇති බව. | වර්ෂයට අදාළ සියලුම ගනුදෙනු ගිණුම් ගත කළ යුතුය. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයට අදාළ පාරිතෝෂික වෙන්කිරිම රු.31,813,587 ක් වුවද විගණනයේදී සිදු කරන ලද ගණනය කිරීම් අනුව එම අගය රු.22,300,913 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2022 දෙසැම්බර් 31 දිනට පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.9,512,675 කින් පිළිවෙලින් අඩුවෙන් | 2023 වර්ෂයේදි ජ ර්නල්' සටහන් මඟින් නිවැරදිව ගිණුම් ගත කර ඇති බව. | වර්ෂයට අදාළ පාරිතෝෂිත නිවැරදිව ගණනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඊ) | ඊකියාලාභීන් 100,000 ක් පුහුණු කිරීමේ “Multi-Purpose Development Task Training Programme” සඳහා බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුවෙන් 2022 වර්ෂය තුලදී ලැබිය යුතු රු. 41,574,974 ක් ගිණුම්ගත කර නොතිබුණි | ලැබිය යුතු මුදල් ඉල්ලුම් කළද එම මුදල් මෙම බලාකය මඟින් ගෙවා දමන බවට තහවුරුවක් මෙතෙක් ලබා දී නොමැති බැවින් ගිණුම්ගත නොකළ බව. | වර්ෂයට අදාළ සියලුම ලැබිය යුතු දෑ අදාල වර්ෂයේ ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට වර්ෂ 1ත් වර්ෂ 5ත් අතර කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු.12,612,299 ක් වූ ණයගැති ශේෂ හා එකතුව රු.10,093,619 ක් වූ ණයහිමි ශේෂ ද, වර්ෂ 5 ට වැඩි එකතුව රු.31,396,431 ක ණයගැති හා එකතුව රු.3,348,035 ක ණයහිමි ශේෂ අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි. | මෙම ණයගැති/ණයහිමි ශේෂ පරීක්ෂා කර බලා නිරවුල් කිරීමට කටයුතු කරන බව | ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571(2) | 2022 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ඇතුලත් වසර 2කට වැඩි කාලයක් ගතව තිබූ එකතුව රු.30,404,624 ක් වූ ගෙවිය යුතු තැන්පතු ශේෂ නිරිවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවා නිදහස් කළ හැකි ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු යොදා ඇත | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 2020/02 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | බඳවාගැනීම් පරිපාටියට පටහැනිව 2020 ජනවාරි 04 දින සිට අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා නිලධාරියෙකු බඳවාගෙන වැටුප් හා දීමනා ලෙස එකතුව රු694,000.ක් වැඩිපුර ගෙවා තිබුණි. | බඳවා ගැනීමේ පරිපාටියෙහි හා පුවත්පත් දැන්වීමෙහි අධ්‍යක්ෂ ජනරාල් තනතුරට රු.86,865/-ක මූලික වැටුපක් හිමි බවට දක්වා ඇති නමුත් බඳවාගත් අධ්‍යක්ෂ ජනරාල්ට ඔහු මීට පෙර ලබාගත් වැටුපට අනුරූප රු.109,565/-ක මූලික | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | | වැටුපක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නිර්දේශය සහ පාලක මණ්ඩල අනුමැතිය මත ගෙවා ඇත. ඒ අනුව ඔහුට මාසිකව වෘත්තීය දිමනාවක් සහිතව රු.37,700 ක අතිරික්ත මුදලක් ගෙවා ඇති බව. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.6,715,737ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.57,777,077ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.64,492,813 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්තැබීමේ ක්‍රමවේදය වෙනස් කිරීම, අමාත්‍යාංශ ප්‍රතිපාදන වැඩිවීම සහ වෙනත් ආදායම් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

අ. 2022 වර්ෂයට සාපේක්ෂව නිපුණතා සිසු සවිය සඳහා ලැබූ ප්‍රදාන සියයට 149කින් ද වෙනත් ආදායම් සියයට 89කින්ද වැඩිවී තිබූ අතර රැකියා ලක්ෂය වැඩසටහන සඳහා ලැබී තිබූ ප්‍රදාන සියයට 82කින් අඩුවී තිබුණි.

ආ. 2022 වර්ෂයේදී නව ප්‍රදාන ලැබීමක් ලෙස රේඛීය අමාත්‍යාංශයෙන් රු.41,130,789ක් උපදේශන කාර්යසාධන දීමනා සඳහා ලැබී තිබුණි.

ඇ. 2022 වර්ෂයට සාපේක්ෂව කාර්යමණ්ඩල පිරිවැය සියයට 81කින් වැඩවී තිබූ අතර මූල්‍ය හා වෙනත් වියදම් සියයට 48 ක් අඩුවී තිබුණි. සාමාන්‍යයක් ලෙස ගත්විට මෙහෙයුම් පිරිවැය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 13.7කින් වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2015 සිට 2022 වර්ෂය දක්වා කාලය තුල මිලදී ගෙන තිබූ ලැප්ටොප් පරිගණක 111 ක් රාජකාරි අවශ්‍යතාවය හා තනතුරේ ස්වභාවය සලකා බැලීමෙන් තොරව නිලධාරීන් 103 දෙනෙකු වෙත ඔවුන්ගේ පෞද්ගලික නම්වලට බෙදාහැර තිබුණි. නිලධාරීන් 04 දෙනෙකුට පරිගණක 02 බැගින් හා නිලධාරීන් දෙදෙනෙකුට පරිගණක 03 බැගින් නිකුත් කර තිබුණු අවස්ථා විගණනයේ දී අනාවරණය විය. | අධිකාරියේ ලැප්ටොප් හා ටැබ් යන්ත්‍ර එකකට වැඩි ප්‍රමාණයක් ලබා ගෙන ඇති නිලධාරීන්ට ඒවා ආපසු භාරදෙන ලෙස දන්වා ඇති බව. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන මිළදී ගැනීම් සිදු කළයුතු අතර මිළදී ගත් වත්කම් වඩා කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | අධිකාරියේ මුද්‍රණ කටයුතු කිරීම සඳහා 11 දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයක් හා රු.10,923,635ක් වටිනා යන්ත්‍රෝපකරණ සහිත වෙනම මුද්‍රණ අංශයක් ස්ථාපිත කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී මුද්‍රණ කටයුතු සඳහා රු.9,134,700 ක් බාහිර පාර්ශවයන් වෙත ගෙවා තිබුණි. | මෙම කාලය තුල අමුද්‍රව්‍ය මිල ඉතා ඉහල අගයක් ගැනීම හා ඇණවුම් වලට අමතරව සුළු මුද්‍රණ දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබී තිබුණි. ඒ අනුව රු. 8,960,200 ක ඇණවුමක් මිලගණන් කැඳවා බාහිරින් සිදුකිරීමට සිදුවිය. ඉදිරියේදී මුද්‍රණාලයෙහි කාර්යක්ෂමතාවය ඉහල නංවාලීමට හා බාහිරින් මුද්‍රණ කටයුතු සිදු නොවීමට කටයුතු කරනු ඇති බව. | අධිකාරියේ සම්පත් උපරිම කාර්යක්ෂමතාවය කින් උපයෝජනය කල යුතුය. |
| (ඇ) | බහුකාර්ය සංවර්ධන කාර්යසාධක බලකා දෙපාර්තමේන්තුව සමඟ ඇතිකර ගත් ගිවිසුමකට අනුව 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද රැකියාලාභීන් 100,000 ක් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.100,835,305 ක් වැයකර අපේක්ෂා කල රැකියාලාභීන්ගෙන් සියයට 35 ක් එනම් 34,660 දෙනෙක් පමණක් පුහුණුව නිමකර තිබුණි. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2021 වර්ෂයේදී රු.4,650,800 ක් වැයකර තොරතුරු පද්ධතියක් ස්ථාපිත කර තිබුණ ද මෙමඟින් රැකියාලාභීන් රැකියාගත කිරීම පිළිබඳ තොරතුරු ලබා ගත නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය යටතේ රැකියා ලාභීන් 100,000 ක් පුහුණු කිරීමට ඉලක්ක කලද එහි පලමු අදියරයේ පුහුණුව සාර්ථකව අවසන් කල රැකියා ලාභීන් 34,660 ක් සඳහා 2023.08.31 වන දින වන විට සහතික පත්‍ර නිකුත් කර ඇති බව . | ව්‍යාපෘතිවල කාර්යසාධනය වර්ධනය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) | කර්මාන්ත සහයෝගීතා ආධුනිකත්ව පුහුණු මධ්‍යස්ථානය යටතේ Higher Diploma in Digital Technician පාඨමාලාව සඳහා විද්‍යාගාරයක් ස්ථාපනය කිරීම වෙනුවෙන් 2021 නොවැම්බර් 19 දින චීන තානාපති කාර්යාලය මඟින් රු.10,099,202 ක් වටිනා අයිතම 84 ක පරිත්‍යාගයක් ලැබී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටද අදාල ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීමට සහ පරිගණක විද්‍යාගාරය ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි. | Higher Diploma in Digital Technical යන පාඨමාලාව ආරම්භ කිරීම සඳහා අවශ්‍ය විද්‍යාගාර පහසුකම් 2022.04.22 දින විටත් සම්පාදනය කර තිබුණි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත ඉදිරියේදී එම පාඨමාලාව ආරම්භ කරනු ලබන බව. | කාර්යසාධනය වර්ධනය සඳහා ලැබෙන ප්‍රතිලාභ කාර්යක්ෂම ලෙස උපයෝජනය කළ යුතුය. |
| (ඉ) | පෙර දැනුම ඇගයීමේ ක්‍රියාවලියට (RPL) සහතිකපත් 5000 ක් බෙදාදීම සඳහා 2015 වර්ෂයේ දී මාතර දිස්ත්‍රික්කයේ පවත්වන ලද නිපුණතා අභිෂේක වැඩසටහනේදී සිදු වී තිබූ අක්‍රමිකතා සම්බන්ධයෙන් පවත්වන ලද විමර්ශනයට අදාල නිර්දේශ 2023 වර්ෂය වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතියට 2015 දී රු.මිලියන 101.9 ක් වියදම් කලද රු. මිලියන 66.41 පමණක් ප්‍රතිපූර්ණය කරන ලද අතර ඉතිරි රු.මිලියන 35.5 ක් ලැබිය යුතු ශේෂයක් ලෙස හඳුනා ගන්නා ලදි. රු.මිලියන 5.5 ක් හොල්සිම් ආයතනයෙන් ලැබුණි. ඒ අනුව ඉතිරි රු. මිලියන 29.9 ක අවසාන ගිණුම් වල නිරූපණය වන බව. | විමර්ශන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කඩිනම්කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීමේ අධිකාරිය පිහිටුවීමේ අරමුණින් බැහැරව පුද්ගලයන් විදේශ රැකියා වලට යොමු කිරීමට 2022 වර්ෂයේදී ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් NAITA Foreign Employment (Private) Limited නමින් සමාගමක් පිහිටුවා බාහිර පුද්ගලයන්ගෙන් රු.මිලියන 1.2ක මුදලක් ලබාගෙන තිබුණද 2023 ඔක්තෝබර් 15 වන දින වන විටත් කිසිදු පුද්ගලයෙක් විදේශ රැකියා සඳහා යොමුකර නොතිබුණි. මෙම සමාගමේ ආදායම් හා වියදම්, පාලන ගිණුමක් මඟින් අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුම හරහා සිදුකර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දිනට මෙම පාලන ගිණුමේ ශේෂය රු.608,385 ක්ව තිබුණි. මෙම සමාගම පූර්ණ අක්‍රිය තත්ත්වයේ පැවතුණද 2023 වර්ෂය සඳහා ද විදේශ රැකියා ඒජන්සියෙහි බලපත්‍රය අලුත් කිරීම සඳහා රු. 224,000ක් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගෙවා තිබුණි. | මේ වන විට එම සමාගම පූර්ණ අක්‍රිය තත්වයේ පවතී. සමාගම විසින් රු. මිලියන 1.2 ක ආදායම් උපයන ලද නමුත් කිසිදු පුද්ගලයෙක් මෙතෙක් විදේශ ගත කර නැති බව.<br>2022 වර්ෂයට අදාලව ප්‍රමාණවත් ගණුදෙනු නොමැති අතර පාලක ගිණුමක් හරහා සියළුම වියදම් හා ආදායම් ගිණුම්ගත කර ඇති බව. | අධිකාරිය පිහිටුවීමේ අරමුණ ක්‍රියාත්මක කිරීමට විශේෂ අවධානය යොමු කළ යුතුය. එසේම අක්‍රීය තත්ත්වයේ බවතින ඒජන්සියේ බලපත්‍ර අලුත් කිරීම සඳහා ගෙවන ලද මුදල් එයට වගකිය යුතු නිලධාරීන්ගෙන් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වෘත්තීය පුහුණුව ලබන සිසුන්ට ශිෂ්‍යාධාර ගෙවීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ලබා දෙන ප්‍රතිපාදන සිසුන් වෙත ලබා දීමට විධිමත් වැඩ පිළිවෙලක් නොතිබීම හේතුවෙන් 2021 හා 2022 වර්ෂවලදී අධිකාරිය වෙත ලබාදී තිබුණු එකතුව රු.55,266,600 කින් රු.10,279,600 ක් සිසුන් වෙත ලබාදීමට කටයුතු නොකර ජංගම ගිණුමෙහි රඳවාගෙන තිබුණි. | අමාත්‍යාංශයෙන් මුදල් ලැබීම හා ආධුනිකයින්ට ගෙවීම් පිළිබඳ විස්තර ලැබීමේ ප්‍රමාදයන් නිසා 2022 වර්ෂයට අදාල ආධුනිකත්ව දීමනාව එම වර්ෂයේදී ගෙවීමට නොහැකි වන අතර ඒවා 2023 වර්ෂයේ මුල්භාගයේ ගෙවීමට සිදු වී ඇති බව. | සිසුන් වෙත ලබා දෙන ශිෂ්‍යාධාර මුදල ප්‍රමාදයකින් තොරව ඔවුන් වෙත ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා 2017 සිට 2020 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී ලැබුණු මුදලින් රු.62,789,505 ක් අදාල අරමුණ වෙනුවෙන් වැය නොකර ගිණුමේ රඳවාගෙන තිබුණි. | ආංශික නිපුණතා සංවර්ධන ව්‍යාපෘතියට ලැබුණු රු.62,789,505ක් ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති බව. | ලැබෙන අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා උපයෝජනය කළ යුතුය. |